මගේ අංකය : ASG(F)/10035/E 09_2020/101
2020 -11-11

සියළුම ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට,

<u>වර්තමානයේ නැවත ව්‍යාප්ත වෙමින් පවතින කොවිඩ් 19 වසංගත තත්වය තුළ කාර්ය මණ්ඩලය සේවයට කැඳවීම.</u>

උක්ත මැයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) හා පලාත් සර්වේයර් ජනරාල්වරුන් ඇමතූ මගේ සමාංක, 2020-10-27 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. මා විසින් යොමුගත ලිපියෙන් ලබාදුන් උපදෙස් අනුව සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් අනුගමනය කරමින් අවම සේවක සංඛ්‍යාවක් කැඳවා, රාජ්‍ය සේවය හැකිතාක්දුරට අඛණ්ඩව සැපයීමට හැකිවන පරිදි දිවයිනේ සෑම ක්ෂේත්‍ර කාර්යාලයකම කටයුතු ක්‍රමවත්ව සැලසුම්කර ක්‍රියාත්මක කල යුතුය. මෙහිදී සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් COVID- 19 ව්‍යාප්තිය වැළැක්වීමට පෙර සූදානම හා ප්‍රතිචාර දැක්වීම ට අදාලව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට නිකුත් කර ඇති විශේෂ මාර්ගෝපදේශයක් වන අතර ඒ පිළිබඳ අවධානය යොමු කරවමි.

යම් අවස්ථාවක ප්‍රාදේශීය මට්ටමේ සෞඛ්‍ය බලධාරීන් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති හා කාලීනව නිකුත්කරන උපදෙස්වලට අමතරව මිනින්දෝරු අධිකාරීන්ට යම් ක්‍රියාමාර්ග ගැනීමට දන්වන්නේ නම් එය ලිඛිතව ලබාගෙන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මගින් පලාත් සර්වේයර් ජනරාල් වෙත දන්වා ඔහුගේ උපදෙස් අනුව කටයුතු කල යුතුය.

03. COVID-19 වසංගතය ව්‍යාප්තවීම වැළැක්වීම අප කාගේත් වගකීම වේ. COVID-19 වසංගතය ව්‍යාප්තවීම දිවයින පුරා සිදුවුවද එක් එක් ප්‍රදේශ සඳහා විටින් විට රජය විසින් දැනුවත්කරන හුදකලා ප්‍රදේශ හා නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම පුරෝකතනය කල නොහැකි දෙයක් බව සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන් ඇතුළු කාර්යය මණ්ඩලය තේරුම් ගත යුතුය. රාජකාරී පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෘත්තීය සමිති ලිඛිතව හා වාචිකව විමසීම් කරන ලද බැවින් දෛනික රාජකාරී ඉටුකිරීම සම්බන්ධව පහත සඳහන් වැඩිමනත් උපදෙස් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.

04. ක්ෂේත්‍ර රාජකාරී ඉටුකිරීමට අදාලව පහත කරුණු වෙත අවධානය යොමු විය යුතුය.

i. පොදු ප්‍රවාහන වලින් සේවයට වාර්තා කරන කාර්යය මණ්ඩලයේ පැමිණීම සම්බන්ධව දුෂ්කරතා වාර්තා වේනම් ඒවායේ සත්‍යතාවය තහවුරු කරගෙන දෛනිකව නිවාඩු අනුමත කිරීම සියළුම අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම වේ. අද දින වන විට රටේ පොදු ප්‍රවාහනවල පවතින ගැටළු නිරාකරණය වෙමින් පවතින බැවින් මෙම තත්ත්වය කාලීනව විසඳා ගැනීමේදී සුදුසු තීරණයන් අධීක්ෂණ නිලධාරීන් විසින් ගත යුතුය.

ii. දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය සඳහා නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් හා වරින් වර සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන උපදෙස් අනුව රාජකාරී සිදු කිරීමට සියළුම කාර්යය මණ්ඩලය බැඳී සිටී. එබැවින් මෙම තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත්වන තෙක් අවම කාර්යය මණ්ඩලයක් කැඳවා ක්ෂේත්‍ර වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීම කල යුතුය. පවතින වාතාවරණය තුල සෞඛ්‍යාරක්ෂිතව රජයේ මිනින්දෝරුවරුනට ක්ෂේත්‍ර රාජකාරීවල යෙදීමට හැකිවන පරිදි ඔවුන් සමඟ සාකච්ඡා කර මිනින්දෝරු අධිකාරී විසින් මාසික වැඩ සටහන් පිළියෙල කල යුතුය.

වැඩ සටහන් පිලියෙල කිරීමේදී හුදකලා ප්‍රදේශ හා ඒ අවට, නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක ප්‍රදේශවල කිසිවිටෙක රාජකාරී සඳහා නොයෙදවිය යුතුය.

iii. හැකි සෑම විටකම ක්ෂේත්‍ර මැනුම් සහායකවරුන් සෘජුවම ක්ෂේත්‍ර රාජකාරී සඳහා ක්ෂේත්‍රයට වාර්තා කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුය. කාර්යය මණ්ඩල ක්ෂේත්‍රයට ප්‍රවාහනය කිරීමේදී වැඩි වාර ගානක් යැවීමට අවශ්‍ය වන අවස්ථා හොඳින් කළමනාකරණය කර ගැනීම සියළුම මිනින්දෝරු අධිකාරීවරුන්ගේ වගකීමකි.

වෙනත් දිස්ත්‍රික්ක හරහා සේවයට කැඳවන නිලධාරීන් සඳහා අවශ්‍ය සෞඛ්‍ය අවසර නිර්දේශයන් ලබාදීම සඳහා සුදුසු පරිදි කටයුතු කිරීමට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා) විසින් එකඟතාවය ලබාදී ඇත. මේ සඳහා අවශ්‍ය තොරතුරු දැනටමත් පලාත් සර්වේයර් ජනරාල්වරුන් වෙතින් ගෙන්වා ගැනීමට අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) විසින් දන්වා යවා ඇත.

**iv.** මායිම් පෙන්වා දීම හෝ මායිම් බලා ගැනීමට අදාලවන ග්‍රාම නිලධාරී/ ඉඩම් නිලධාරීන් ලිඛිතව දන්වා, පැමිණීම ලිඛිතව සනාථ කරගෙන ක්ෂේත්‍ර රාජකාරී වල යෙදිය යුතුය. ඔවුන් රාජකාරී සඳහා වාර්තා නොකරන්නේ නම් ඒ බව මිනින්දෝරු අධිකාරී වරුන් විසින් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වරුන්ටද පිටපත් සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දන්වා මැනුම තාවකාලිකව නතර කල යුතුය. එම සටහන් මැනුම් ඉල්ලීම් ගොනුවට ගොනු කල යුතුය. හදිසි අවස්ථාවලදී මෙම කාරණය සම්බන්ධව වඩාත් සුදුසු තීරණයක් ලබාදීම මිනින්දෝරු අධිකාරී ගේ වගකීමකි. මෙම තීරණයන් ඉහත යොමුගත ලිපියේ ඡේද 05 අනුව ලේඛණයක සටහන් කල යුතුය.

**v.** යම් අවස්ථාවක පෞද්ගලිකව ඉඩම් හිමියන් කොරෝනා තත්ත්වය හේතුවෙන් මැනුම් කිරීමට විරෝධතා ඉදිරිපත් කරන්නේ නම් ඒ බව ලිඛිතව රජයේ මිනින්දෝරුවරයා විසින් එදිනම මිනින්දෝරු අධිකාරී වෙත වාර්තා කර එම මැනුම් ඉල්ලීම තාවකාලිකව නතර කල යුතුය. එවැනි අවස්ථාවල මිනින්දෝරු අධිකාරී විසින් වැඩ සටහන් සංශෝධනයන් කල යුතුය.

**vi.** මෙම කාලය තුල රජයේ මිනින්දෝරුවරුන් අතැති පිඹුරු වැඩ හා සංශෝධන අවසන් වී ඇත්නම් හා ක්ෂේත්‍ර රාජකාරී සඳහා යෙදවීමට බාධා ඇත්නම් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වරුන්ගේ උපදෙස් හා ලිඛිත අනුමැතිය යටතේ දෙමැරෙ පරිච්ඡේද 17 හි දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැරණි පිඹුරු අංකිතකරණය කිරීම සිදු කල හැක. මිනින්දෝරු අධිකාරී වරුන් විසින් එම කාර්යය සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (ඉතොප) වෙතින් ලබාගත යුතුය. අංකිතකරණය කරන රාජකාරී සඳහා ප්‍රගතිය ලබාදීමක් සිදුනොකරන අතර අධික්ෂණ නිලධාරීන්ගේ නිර්දේශය අනුව මවිසින් එම නිළධාරීන්ගේ සේවා ඇගයීමට කටයුතු කරමි.

AWL Perera

ඒ.එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා
සර්වේයර් ජනරාල්

ඒ.එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

පිටපත්:

| | | |
|---|---|---|
| අතිරේක සර්වේයර් ජනරාල්වරුන් | : | දැ.ගැ.ස හා අ.ක.ස. |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන් | : | දැ.ගැ.ස හා අ.ක.ස. |
| නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන් | : | දැ.ගැ.ස හා අ.ක.ස. |